# 2022 ජුනි මාසයට අදාලව 2022.06.21 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2022.06.21
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 11. ජේ.ඒ. අමාලී කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 12. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 13.ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හෙබ වීය.2022.05.24 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.06.15 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

එහි දී ගරු කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා හා බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා වාර්තාවේ 05.01.18 යෝජනාව වන නාගරික හා ළමා උද්‍යානයක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගැනිම සම්බන්ධව යෝජනාවෙහි ඇතුලත් නොවූ කරුණු පිළිබඳ පැවසීය.

**ගරු කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා** මෙම යෝජනාව මඟින් සිදුකර ඇත්තේ ඉඩම **ලක්ෂ 50 ක් පමණ වටිනාකමකින් යුක්ත වන නමුත් එම ඉඩම තක්සේරු කොට** සභා අරමුදලින් ලබා ගැනීම සුදුසු බවටයි. එබැවින් මෙම ඉඩම තක්සේරු කර එක වර නොකර එකින් එක කිරිම සුදුසු බවත් මෙම ඉඩමට අනාගතයේ දී හොඳ වෙළඳ වටිනාකමක් ලැබෙන බැවින් මෙම ස්ථානය සුදුසු බවට අදහස් දැක්වීම ඇතුලත් කර සංශෝධනය කිරීම.

**බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා,** පොදු වෙළඳපල මාර්ගයේ ගල් ගැලවී පයින් මෙන්ම වාහනවලින්ද ගමන් කිරීමට නොහැකි බවත් එවැනි මාර්ග සංවර්ධනය සඳහා මුදල් යෙදවීම මෙම ඉඩම් මිල දී ගන්නවාට වඩා සුදුසු බවට දැක්වූ අදහස ඇතුලත් කර සංශෝධනය කිරීම.

අනතුරුව ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා වාර්තාවේ ඉහත සංශෝධනයන්ට යටත්ව පසුගිය වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි. ඒ අනුව 2022.05.24 දිනැති මහ සභා වාර්තාව සභා සම්මත විය.

02. **මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.**

## 2.1. සියළුම මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධවයි.

සියළුම පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුනගේ 2022 වර්ෂයට අදාලව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇති බැවින් අද දිනයේ ම එම ප්‍රකාශ සම්පූර්ණ කර කාර්යාලයට ලබා දෙන ලෙස සියළු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනිම සඳහා නිවේදනය කළේය.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබිම.

**ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා**

බිබිල, දියකොබල, කුරගම්මන, කෙහෙලඅත්තාවෙල ගොවි සංවිධානයේ ගම් වාසීන් විසින් හැපොල ඔය හරහා පාලමක් ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ආධාර ලබා දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

බිබිල, වැගම, රන්තරු පෙරපාසල ලිපිනයේ පදිංචි එච්.එම්. රේණුකා මහත්මිය විසින් මෙම පෙර පාසලෙහි දරුවන්ගේ සනීපාරක්ෂාව උදෙසා වර්ල්ඩ් විෂන් ආයතනය විසින් නළ ළිඳක් නිමකර දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර එය නිම කර ගැනීම සඳහා ඉඩමෙහි ගැටළුවක් ඇති බැවින් එම ඉඩම මැනුම් කටයුතු කර ඉඩම නිරවුල් කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

**ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා**

බිබිල,කොටගම,මූදියල,භාග්‍යා නිවස ලිපිනයේ පදිංචි ඒ.එම්.රෝහණ සමන් කුමාර මයා විසින් බිබිල,කොටගම, මූදියල මාර්ගයේ අපැහැදිලි පෙනෙන වංගුවක් ඇති බැවින් එම ස්ථානයට වීථි ලාම්පුවක් සවි කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

බිබිල,කොටගම, කිවුලේ අරාව ලිපිනයේ පදිංචි ආර්.එම්.ප්‍රියදර්ශනී නිර්මලා මහත්මි විසින් ළගම සේවා ස්ථානය වන කොටගම මහජන පුස්තකාලයට අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

ප්‍රශ්නය යොමුකල අය :- ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා

යොමුකල ප්‍රශ්නය :- 2022 මාර්තු මස 22 වන දින පවත්වන ලද මහ සභා රැසිවීමේ දී 05.01.13 සභා යෝජනාවට අනුව කර්මාන්ත 21ට අදාල යෝජනා හා ඇස්තමේන්තු මුදල සභා සම්මත වුවත් මේ වන විටත් එම කර්මාන්ත ආරම්භ කිරීමට කටයුතු නොකරන්නේ මන්ද ? .

**පිළිතුර :-**

පරණ ගොඩනැගිලි මිල කැඳවුම් ලේඛනයට අනුව මෙම කර්මාන්ත සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර අද වන විට සිමෙන්ති හා අමු ද්‍රව්‍යවල මිල සීග්‍ර ලෙස ඉහල යාම නිසා පරණ ඇස්තමේන්තුවට මෙය කළ නොහැකි බැවින් අලුත් ගොඩනැගිලි මිල කැඳවුම් ලේඛනයක් ගොඩනැගිලි ඉංජිනේරුතුමා විසින් සකස් කරගෙන අලුත් ඇස්තමේන්තුව සකස් කර ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුයි යන්න දන්වා සිටින ලදි.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.මූලාසනය විසින් කරන ලද යෝජනා.

## 05.01.01.ඉන්ධන ආධාරයක් ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ ජල අංශයේ බිල් පත් නිකුත් කිරීමට හා ජල නඩත්තු කිරීම සඳහා යොදවා ඇති සේවකයින්ට අදාළ ස්ථානවලට ගමන් කිරීමේ දී පවතින ඉන්ධන අර්බුදය හමුවේ ගැටළු රාශියකට මුහුණ පෑමට සිදු වී ඇති බැවින් එම කටයුතු බාධාවකින් තොරව කර ගෙන යාමට ඉන්ධන ආධාරයක් අවශ්‍ය බව ලිපිමඟින් දන්වා ඇති අතර ඒ පිළිබඳව සලකා බලා අදාල ඉන්ධන ආධාරයක් ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම ක්ෂේත්‍ර නිලධාරීන් මීට පෙර තම අතින් වියදම් කර රාජකාරි කටයුතු කළ අතර ඉන්ධන මිල ඉහල යාම නිසා මෙය ගැටළුවක් වී ඇති බැවින් ක්ෂේත්‍ර නිලධාරින් හඳුනාගෙන දෛනික පාරිභෝජනය වන ප්‍රමාණය ද හඳුනාගෙන ඒ පිළිබඳ කාර්මික නිලධාරිතුමියගෙන් වාර්තාවක් රැගෙන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ක්ෂේත්‍ර නිලධාරීන් මීට පෙර තම අතින් වියදම් කර රාජකාරි කටයුතු කළ අතර ඉන්ධන මිල ඉහල යාම නිසා මෙය ගැටළුවක් වී ඇති බැවින් ක්ෂේත්‍ර නිලධාරින් හඳුනාගෙන දෛනික පාරිභෝජනය වන ප්‍රමාණය ද හඳුනාගෙන ඒ පිළිබඳ කාර්මික නිලධාරිතුමියගෙන් වාර්තාවක් රැගෙන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.02. බිබිල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට ඖෂධ මිලදී ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව මඟින් පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි සේවය කරන වෛද්‍ය එම්.කේ.එන්.ජී සඳුන්ගම මහත්මිය විසින් ආයුර්වේද මධ්‍යස්ථානය තුල ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය ඖෂධ හිඟ වී ඇති බවත් රෝගීන් හට ප්‍රතිකාර කටයුතු කිරීමට එය බලපා ඇති බවත් එම හිඟ ඖෂධ ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්

ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම සාධාරණ බැවින් අවශ්‍ය කටයුතු සපුරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි. එම හිඟ ඖෂධ ලැයිස්තුව පහත සඳහන් කරමි.

| ඖෂධ වර්ග | ප්‍රමාණය | ඒකක මිල | ගණන | මුළු මුදල |
|---|---|---|---|---|
| රාස්නා සප්තක ක්වත | මි.ග්‍රෑ. 750 | 490.00 | 05 | 2450.00 |
| දශමූල ක්වාත | මි.ග්‍රෑ.750 | 530.00 | 10 | 5300.00 |
| ඒරණ්ඩ සප්තක ක්වාත | මි.ග්‍රෑ.750 | 400.00 | 06 | 2400.00 |
| දෙනිඹ දෙබටු | මි.ග්‍රෑ.750 | 680.00 | 05 | 3400.00 |
| මධූකා සිරප් | මි.ග්‍රෑ.750 | 900.00 | 02 | 1800.00 |
| කනකාසවය | මි.ග්‍රෑ.750 | 320.00 | 02 | 640.00 |
| **එකතුව** | | | | **15990.00** |
| <u>තෙල්වර්ග</u><br>නීලයාදි | මි.ග්‍රෑ.750 | 1940.00 | 05 | 9700.00 |
| සර්වවිෂාදි | මි.ග්‍රෑ.750 | 2500.00 | 01 | 2500.00 |
| නිර්ගුණ්ඩි | මි.ග්‍රෑ.750 | 1680.00 | 06 | 10080.00 |
| ත්‍රිපලා | මි.ග්‍රෑ.750 | 1620.00 | 10 | 16200.00 |
| දිව්‍යාංගනාදි | මි.ග්‍රෑ.750 | 1570.00 | 03 | 4710.00 |
| **එකතුව** | | | | **43190.00** |
| <u>ගුලි වර්ග</u><br>යෝගරාජ | ග්‍රෑ.250 | 1500.00 | 03 | 4500.00 |
| මේදහරණී | ග්‍රෑ.250 | 950.00 | 02 | 1900.00 |
| චන්ද්‍රප්‍රභා | ග්‍රෑ.250 | 1750.00 | 01 | 1750.00 |
| ගෝසපුර | ග්‍රෑ.250 | 2400.00 | 01 | 2400.00 |
| කෛශෝර | ග්‍රෑ.250 | 2000.00 | 01 | 2000.00 |
| **එකතුව** | | | | **12550.00** |
| <u>කල්ක වර්ග</u><br>නවරත්න | ග්‍රෑ.250 | 580.00 | 10 | 5800.00 |
| ලාසෂාදි | ග්‍රෑ.250 | 590.00 | 05 | 2950.00 |
| රෝගානිකාගි | ග්‍රෑ.250 | 660.00 | 03 | 1980.00 |
| වචන | ග්‍රෑ.400 | 1000.00 | 01 | 1000.00 |
| **එකතුව** | | | | **11730.00** |
| දශාංග ලේප | ග්‍රෑ.500 | 1300.00 | 05 | 6500.00 |
| මාණිභද්‍ර චූර්ණය | ග්‍රෑ.500 | 450.00 | 03 | 1350.00 |
| සුකුමාර චූර්ණය | ග්‍රෑ.500 | 390.00 | 03 | 1170.00 |
| ධාත්‍රි චූර්ණය | ග්‍රෑ.500 | 390.00 | 02 | 780.00 |
| ත්‍රිපලා චූර්ණය | ග්‍රෑ.500 | 590.00 | 02 | 1180.00 |
| **එකතුව** | | | | **10980.00** |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් එකඟතාව විමසීය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03.කොටගම ප්‍රදේශය තුළ ජංගම ආයුර්වේද වෛද්‍ය සායනයක් පැවැත්වීම සම්බන්ධවයි.

දැනට පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබන රෝගීන් හට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා දුර බැහැර යාමට අපහසු බැවින් සතියකට එක් දිනයක් බැගින් ජංගම සේවාව සඳහා ආයුර්වේද වෛද්‍ය නිලධාරී ඇතුළු කණ්ඩායම සෑම සතියේ සෑම සිකුරාදා දිනයකම කොටගම ප්‍රාදේශයට යෙදවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහි දී සතියකට එක් දිනක් යොදා ගැනීමටත් එදින උදේ කාලයේ දී මූදියල ප්‍රදේශයටත් සවස් කාලයේ දී කොටගම ප්‍රදේශයටත් යෑම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සතියකට එක් දිනක් යොදා ගැනීමටත් එදින උදේ කාලයේ දී මූදියල ප්‍රදේශයටත් සවස් කාලයේ දී කොටගම ප්‍රදේශයටත් යෑම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. වීපී රේඛා සහතික ,ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර හා ඉඩම් අනු කොටස් අවසර පත්‍ර නිකුත් කිරීමේදී පරීක්ෂණ හා සේවා ගාස්තු අය කිරීම.

බිබිල ප්‍රාදේශීය සභාව මගින් වීපීරේඛා සහතික නිකුත් කිරීමේදී ,ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර හා ඉඩම් අනුබෙදුම් අවසර පත්‍ර නිකුත් කිරීමේදී අයකරනු ලබන ගාස්තු වලට පරීක්ෂණ හා සේවා ගාස්තු ලෙස රු.120.00 ක් එකතු කර අය කරනු ලැබේ.මෙකී රු.120.00 ක මුදල කාර්මික නිලධාරී සඳහා රු.100.00 ක් හා විෂය භාර නිලධාරී සඳහා රු.20.00ක් වශයෙන් වසර අවසානයේදී ලබා ගනු ලැබේ.මෙම පරීක්ෂණ හා සේවා ගාස්තු පෙර වර්ෂ වල සිටම ලබාගෙන ඇති අතර 2022.01.01 දින සිට ඉදිරියටද මෙම ගාස්තු ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05. සැලසුම් කමිටු දීමනා සංශෝධනය කිරීම.

සැලසුම් කමිටු සාමාජිකයන් සඳහා මීට පෙර එක් කමිටු දිනයක් සඳහා රු.750.00 බැගින් ගෙවීම් කර ඇත.මෙම කමිටු දීමනාව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකගේ අංක

DDG/P2/PC/LA හා 2022 මැයි 26 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය සභා සැලසුම් කමිටු සඳහා එක් සාමාජිකයෙකුට දිනකට රු.1500.00 ක් ලෙසට ගෙවීම් සංශෝධනය කරන ලෙස දන්වා ඇත. එබැවින් මෙම සංශෝධිත සැලසුම් කමිටු දීමනාව 2022 වර්ෂයේ ජුනි මාසයෙන් පසු ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.06.ප්‍රජා ශාලාව, මාතෘ සායන හා සුසාන භූමියේ වැඩ අවසන් කිරීම සඳහා අමු ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධවයි.</u>

රදලියද්ද සමාධි සංවිධානය විසින් රදලියද්ද ප්‍රජා ශාලාව, මාතෘ සායනය හා ආදාහනාගාරයේ වහලය හා බිම් මහලේ නිම නොවූ වැඩ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වන කම්බි, වැලි , සිමෙන්ති, වැහිපිහිලි , සී පර්ලින්, අමානෝ තහඩු ,වඩිම්බු ,සිරප් ,බයින්ඩින්, ආවරණ දැල්,එල්ලයරින්, බොක්ස් බාර්,බ්ලොක්ගල් හා මැටල් ලබා ගැනීමට රුපියල් ලක්ෂ 30කට ආසන්න මුදලක් වැය වන බැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහි දී අප ආයතනයේ කාර්මික නිලධාරිතුමියගෙන් එම අමු ද්‍රව්‍ය සඳහා ඇස්තමේන්තුවක් ලබා ගෙන වැඩ නිම කිරිමට අදාල අමුද්‍රව්‍ය ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අප ආයතනයේ කාර්මික නිලධාරිතුමියගෙන් එම අමු ද්‍රව්‍ය සඳහා ඇස්තමේන්තුවක් ලබා ගෙන වැඩ නිම කිරිමට අදාල අමුද්‍රව්‍ය ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.07. දැව ප්‍රවාහනය කිරීම හේතුවෙන් හානිවූ මාර්ගය පිලිසකර කිරීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් කරගහවෙල ප්‍රදේශයේ දැව ව්‍යාපාර කටයුතුවල නියලී දැව ප්‍රවාහනය කිරීම නිසා හානි සිදු වූ මාර්ගය පිළිසකර කර දෙනු ලැබුවත් එය ප්‍රමානවත් නොවන බව ප්‍රදේශවාසින් විසින් දන්වා ඇත. එය නැවත සකස් කිරීම සඳහා වැය වන මුදල ඇස්තමේන්තුකර ඔහුගෙන් ඉල්ලා ඇතත් මේ වන තෙක් ලබාදී නැත. එබැවින් ඉදිරි කටයුතු කිරිම සඳහා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කාරක සභාවක් බවට පත් කිරීමෙන් අනතුරුව බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් කරුණු පැහැදිලි කල අතර එහි දී දැනට අවුරුදු 26 ක කාලයක් තමාගේ වෘත්තීය වන්නේ දැව අලෙවි කිරීම බවත් ඇතැම් අය මෙම ව්‍යාපාරය වැරදි රැකියාවක් ලෙස සලකන නමුත් මෙහි දී සිදු වන්නේ ගම්මුන්ගේ අතිරික්ත ගස් ලබා ගෙන ඔවුන්ට ඒවා මුදල් කර දීම බවත් මීට පෙර කරගහවෙල ප්‍රදේශයේ අබලන් මාර්ගයක් තමා අතින් නිම කර දී තමා ආදර්ශයක් දුන් පුද්ගලයෙක් වන බවත් චෝදනා ලද මාර්ගය තමන් අළුත් වැඩියා කොට දින 04 කින් පසුව තවත් දැව ලොරියක් එම මාර්ගයෙන් යෑම නිසා මාර්ගය නැවත අබලන් වූ බවත් එම දැව ලොරිය මේ සම්බන්ධ තමාට චෝදනා කල පුද්ගලයාගේ දැව ලොරියක් වන බවත් එම මාර්ගය අඟල් 04ක පමණ ඝන කමක් ඇති බවත් එම මාර්ගයද ප්‍රමිතියකින් තොරව ඉදි කර ඇති බවත් මෙම චෝදනාව කල පුද්ගලයාට කරුණු පැහැදිලි කල දුන් පසු දැන් මේ පිළිබඳ අවබෝධයක් ඇති බවත් තමාගේ අතින් විනාශ වූ මාර්ගය තමන් නිවැරදිව සකස් කල නිසා නැවත එය සකස් නොකරන බවත් ප්‍රාදේශීය ලේකම් වෙත තමා විසින් මේ පිළිබඳව විස්තරාත්මක ලිපියක් ලබා දෙන බවත් පැවසීය. එහි දී මේ පිළිබඳ විස්තර සඳහන් කර ප්‍රාදේශීය ලේකම්ට ලිපියක් යැවීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ පිළිබඳ විස්තර සඳහන් කර ප්‍රාදේශීය ලේකම්ට ලිපියක් යැවීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.නිර්වන්දි ගිවිසුමකට යටත්ව තාප්ප ඉදිකිරිම සම්බන්ධවයි.

බිබිල, මහියංගන පාර ,ඉසුරු උයන හි පදිංචි ජේ.පී.ලීලාරත්න මහතා තාප්පයක් ඉදි කිරිම සඳහා සංවර්ධන කාර්යයන් සඳහා අවසර ලබා ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත.මෙම අයදුම්පත්‍රය 2022.04.05 දින ප්‍රාදේශීය සභාවේදී පවත්වනු ලැබූ සැලසුම් කමිටුවට ඉදිරිපත් කළ අතර එහිදී තීරණය කරන ලද්දේ මාර්ග රක්ෂිත හැර ගොඩනැගිලි සීමාව තුළ බිබිල ප්‍රාදේශීය සභාවේ නිර්වන්දි ගිවිසුමකට යටත්ව තාප්පය ඉදිකිරීම සුදුසු බවයි.එබැවින් ප්‍රාදේශීය සභාවේ නිර්වන්දි ගිවිසුමකට යටත්ව එමතාප්ප ඉදිකිරිමට අවසර ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ප්‍රාදේශීය සභාව විසින් නිර්වන්දි ගිවිසුමකට එළඹීම වාසි සහගත බැවින් නිර්වන්දි ගිවිසුමේ ආකෘතිය සභා සම්මත කර ගත යුතුයි.ඉදිරියේ දී ඉදි කිරීමට බලාපොරොත්තු වන හා කලින්

ඉදි කල තාප්ප සඳහා මෙය අදාල වේ.පනතෙහි ඇතුලත් වන ආකාරයට තාප්ප ඉදි කර නොමැති නම් ගලවා ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට හැකි වනුයේ නිරිවන්දි ගිවිසුමකට එලඹී ඇත්නම් පමණි. එබැවින් ඉදි කල තාප්ප්ද නිරිවන්දි ගිවිසුමට ගත යුතු බවත් ජේ.පී.ලීලාරත්න මහතා ප්‍රාදේශීය සභාව සමඟ නිර්වන්දි ගිවිසුමකට එළඹීම වාසි සහගත බැවින් නිර්වන්දි ගිවිසුමේ ආකෘතිය සහා සම්මත කර ගත යුතුවේ.ඉදිරියේ දී ඉදි කිරීමට බලාපොරොත්තු වන හා කලින් ඉදි කල තාප්ප සඳහා මෙය අදාල වේ.පනතෙහි ඇතුලත් වන ආකාරයට තාප්ප ඉදි කර නොමැති නම් ගලවා ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට හැකි වනුයේ නිර්වන්දි ගිවිසුමකට එලඹී ඇත්නම් පමණි. එබැවින් ඉදි කල තාප්පද නිර්වන්දි ගිවිසුමට ගත යුතු බවත් ජේ.පී.ලීලාරත්න මහතා ගිවිසුමට අනුව තාප්පය ඉදි කර නොමැති බැවින් කාර්මික නිලධාරිතුමිය විසින් එය පරීක්ෂා කර බලා කඩා ඉවත් කල පසු ගිවිසුම අත්සන් කිරීම සුදුසු බවත් ගොඩනැගිලි සැලසුම් පත්‍රය අනුමත කිරීමේ දී එම පත්‍රිකාවටම තාප්පයක් ඉදි කිරීමට අදාල නීති රීති ඇතුලත් කිරිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ප්‍රාදේශීය සභාව විසින් නිර්වන්දි ගිවිසුමකට එළඹීම වාසි සහගත බැවින් නිර්වන්දි ගිවිසුමේ ආකෘතිය සහා සම්මත කර ගත යුතුයි.ඉදිරියේ දී ඉදි කිරීමට බලාපොරොත්තු වන හා කලින් ඉදි කල තාප්ප සඳහා මෙය අදාල වේ.පනතෙහි ඇතුලත් වන ආකාරයට තාප්ප ඉදි කර නොමැති නම් ගලවා ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට හැකි වනුයේ නිර්වන්දි ගිවිසුමකට එලඹී ඇත්නම් පමණි. එබැවින් ඉදි කල තාප්ප්ද නිරිවන්දි ගිවිසුමට ගත යුතු බවත් ජේ.පී.ලීලාරත්න මහතා ප්‍රාදේශීය සභාව විසින් නිර්වන්දි ගිවිසුමකට එළඹීම වාසි සහගත බැවින් නිර්වන්දි ගිවිසුමේ ආකෘතිය සහා සම්මත කර ගත යුතුයි.ඉදිරියේ දී ඉදි කිරීමට බලාපොරොත්තු වන හා කලින් ඉදි කල තාප්ප සඳහා මෙය අදාල වේ.පනතෙහි ඇතුලත් වන ආකාරයට තාප්ප ඉදි කර නොමැති නම් ගලවා ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට හැකි වනුයේ නිර්වන්දි ගිවිසුමකට එලඹී ඇත්නම් පමණි. එබැවින් ඉදි කල තාප්පද නිර්වන්දි ගිවිසුමට ගත යුතු බවත් ජේ.පී.ලීලාරත්න මහතා ගිවිසුමට අනුව තාප්පය ඉදි කර නොමැති බැවින් කාර්මික නිලධාරිතුමිය විසින් එය පරීක්ෂා කර බලා කඩා ඉවත් කල පසු ගිවිසුම අත්සන් කිරීම සුදුසු බවත් ගොඩනැගිලි සැලසුම් පත්‍රය අනුමත කිරීමේ දී එම පත්‍රිකාවටම තාප්පයක් ඉදි කිරීමට අදාල නීති රීති ඇතුලත් කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09.අංක 03 දරණ එළවළු කඩකාමරයේ අයිතිය මාරු කිරීම සම්බන්ධවයි.

අංක 03 දරණ එළවළු කඩ කාමරය බදුගෙන සිටි බිබිල,කනුල්වෙල ලිපිනයේ පදිංචි ඩබ්.තාජිදින් යන අයට අංක 03 දරණ එළවළු කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් අඹගහපිට මුල්ල, පිටදෙනිය, මැදගම ලිපිනයේ පදිංචි එච්.එම්.සුමනාවතී මහත්මිය වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එච්.එම්.සුමනාවතී මහත්මිය විසින් එම කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10.මාසික සභා වාර්තාව වට්ස්ඇප් හා ඊ මේල් මාර්ගයෙන් ලබා දීම සම්බන්ධවයි.

රට තුළ දැනට පවතින කඩදාසි හිඟය සහ ඉන්ධන අර්බුදය හේතුවන් මාසික සභා වාර්තාව හා න්‍යාය පත්‍රය මුද්‍රණය කර ලබා දීම ගැටළු සහගත බැවින් ඊට පිළියමක් වශයෙන් නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් මාසික සභා වාර්තාව බෙදා හැරීමට අපේක්ෂා කරමි. ඒ අනුව වට්ස්ඇප් හා ඊ මේල් මඟින් මින් ඉදිරියට ලබා දීමටත් මෙම පහසුකම් නොමැති මන්ත්‍රීවරුන් සඳහා මුද්‍රිත මාසික සභා වාර්තාව ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී ඇතැම් මන්ත්‍රීවරුන් සභා වාර්තා වට්ස්ඇප් හා ඊ මේල් මඟින් ලබා ගැනීමට කැමති බවත් ඇතැම් මන්ත්‍රීවරුන් අකැමති බවත් ප්‍රකාශ කල අතර එය පහත දැක්වේ.

| මන්ත්‍රීවරුන්ගේ/වරියන්ගේ නම | වට්ස්ඇප් හා ඊ මේල් මඟින් ලබා ගැනීමට කැමති | වට්ස්ඇප් හා ඊ මේල් මඟින් ලබා ගැනීමට අකැමති |
|---|---|---|
| එස්.ඒ.එම්.චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | | ✓ |
| බී. විල්මට් සිල්වා මැතිතුමා | ✓ | |
| කේ.එම්.කපිල විජේසූරිය මැතිතුමා | ✓ | |
| ආර්.බී.අත්තනායක මැතිතුමා | | ✓ |
| ඒ.එම්. නදීශා ජයමිණි ගුණසේකර මැතිතුමිය | ✓ | |
| බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | | ✓ |
| කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | | ✓ |
| එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | ✓ | |
| ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය | ✓ | |
| ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | | ✓ |
| ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | | ✓ |
| 17. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | ✓ | |

එහි දී ඉහත ආකාරයට සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඇතැම් මන්ත්‍රීවරුන් සභා වාර්තා වට්ස්ඇප් හා ඊ මේල් මඟින් ලබා ගැනීමට කැමති බවත් ඇතැම් මන්ත්‍රීවරුන් අකැමති බවත් ප්‍රකාශ කල අතර එහි දී ඉහත ආකාරයට සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11.පුවක් පැලේ ඝණ අපද්‍රව්‍ය ඒකකයට කාබනික පොහොර කුඩු කරන හා හලන මැෂින් ලබා ගැනීම සම්බන්ධවයි.

පුවක් පැලේ ඝණ අපද්‍රව්‍ය ඒකකයේ කාබනික පොහොර නිෂ්පාදන කටයුතු ආරම්භ කර හය මාසයක් වන අතර මේ වන විට නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කිලෝ දාහකට ආසන්න වේ.පොහොර කුඩු කරන හා හලන මැෂින් නොමැති නිසා පොහොර කොටස් ගොඩ ගැසී ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණය ද ඇහිරී ඇත. මෙම මැෂින් දෙක (අත්ට්‍රැක්ටර් එන්ජිමෙන් ක්‍රියා කරන) සඳහා වර්තමාන වෙළඳපොලේ වටිනාකම රු.ලක්ෂ අටක් පමණ වන බැවින් මෙම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ඇල්බීසියා හා මානම් කැබලි කිරීමටත් ඒවා හැලීමටත් අවශ්‍ය බැවින් පොහොර කුඩු කරන හා හලන මැෂින් එකක් අත්‍යවශ්‍ය බැවින් මෙම මැෂින් දෙක (අත්ට්‍රැක්ටර් එන්ජිමෙන් ක්‍රියා කරන) ලබා ගැනීමට සුදුසු බවත් අප ආයතනය තුල ඇති දැනට භාවිතයට නොගන්නා අත්ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සුදුසු බවත් ඉදිරියේ දී තවත් මිල ගණන් ඉහල යාම නිසා මෙය කඩිනමින් සිදු කර ගැනීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ඇල්බීසියා හා මානම් කැබලි කිරීමටත් ඒවා හැලීමටත් අවශ්‍ය බැවින් පොහොර කුඩු කරන හා හලන මැෂින් එකක් අත්‍යවශ්‍ය බැවින් මෙම මැෂින් දෙක (අත්ට්‍රැක්ටර් එන්ජිමෙන් ක්‍රියා කරන) ලබා ගැනීමට සුදුසු බවත් අප ආයතනය තුල ඇති භාවිතයට නොගන්නා අත්ට්‍රැක්ටරය අලුත්වැඩියා කර ඒ සඳහා යොදා ගැනීම සුදුසු බවත් ඉදිරියේ දී තවත් මිල ගණන් ඉහල යාම නිසා මෙය කඩිනමින් සිදු කර ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.12.බැංකු ගිණුමක් විවෘත කිරිම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දැනට ක්‍රියාත්මක වන cat 2020 කාර්යාල මෘදුකාංග පද්ධතිය මගින් මහ ජනතාවට පහසුකම් සැලසීම සඳහා මාර්ග ගත ක්‍රමය ඔස්සේ ගෙවීම් කිරීමේ අවකාශය ලබා දීමට Payment getway එක ලබා ගැනීම සඳහා වානිජ බැංකු වෙතින් මිල ගණන් කැඳවන ලද අතර අප ආයතනය වෙත මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ ලංකා බැංකුව පමණි. ඒ අනුව payment getway එක ලංකා බැංකුවෙන් ලබා ගැනීමට සිදු වේ.එහෙත් අප ආයතනයේ ගිණුම් ඇත්තේ මහජන බැංකුවේ වන බැවින් payment getway එක ලංකා බැංකුවෙන් ලබා ගැනීමට සිදු වන නිසා payment getway එක හරහා මහජනතාව විසින් සභාවට සිදු කරන ගෙවීම් ලබා ගැනීමට ලංකා බැංකුවෙහි ඉතිරි කිරීමේ හෝ ජංගම ගිණුමක් විවෘත කලයුතු අතර එම ගිණුම විවෘත කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13.අත්‍යාවශ්‍ය සේවාවන්වල නියුතු නිලධාරීන් හට ඉන්ධන ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ විෂය භාර නිලධාරී ඩී.එම්.හසිත මධුෂාන් මයා විසින් සභාවේ අත්‍යාවශ්‍ය සේවාවන්වල නියුතු නිලධාරීන් හට දැනට පවතින ඉන්ධන හිඟය හේතුවෙන් තම රාජකාරී සිදු කිරීමට අපහසු වී ඇති බැවින් අවශ්‍ය ඉන්ධන සභාව මගින් නිකුත් කරන ඉන්ධන ඇණවුමක් මගින් ලබා ගෙන ඔවුන්ට බෙදා දීමට කටයුතු කිරීමට හා එම ඉන්ධන සඳහා මුදල් ඔවුන්ගෙන් ලබා ගෙන ඉන්ධන පිරිවුම් හල වෙත පියවීම සිදු කල හැකි අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කාර්මික නිලධාරිතුමිය හා විෂය භාර නිලධාරි ඩී.එම්.හසිත මධුෂාන් මහතා එක්ව අත්‍යාවශ්‍ය සේවාවන්වල නියුතුවිය යුතු නිලධාරීන්ගේ අවශ්‍යතාවය හඳුනාගෙන ඔවුන්ට අදාල ප්‍රමාණයෙන් ඉන්ධන ලබා දීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
එහි දී කාර්මික නිලධාරිතුමිය හා විෂය භාර නිලධාරි ඩී.එම්.හසිත මධුෂාන් මහතා එක්ව අත්‍යාවශ්‍ය සේවාවන්වල නියුතුවිය යුතු නිලධාරීන්ගේ අවශ්‍යතාවය හඳුනාගෙන ඔවුන්ට අදාල ප්‍රමාණයෙන් ඉන්ධන ලබා දීම සුදුසු බවටත් තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍ර සූත්‍ර කුලියට දීමේ මිල ගණන් සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් යන්ත්‍ර සූත්‍ර කුලියට දිමේදී දැනට පවතින මිල ගණන් යටතේම ලබාදීම ඉන්ධන මිළ ඉහල යාම නිසා අපහසු වි ඇත.එබැවින් එම මිළ ගණන් වෙනස් කිරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා පහත සඳහන් මිල ගණන් යටතේ කුලියට දීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | වාහන වර්ගය | 2022 වර්ෂයේ පවතින මිල (රු.) | වෙනස් විය යුතු මිල ගණන් රු. |
|---|---|---|---|
| 01 | මෝටර් ග්‍රේඩරය (මීටර් පැය එකක් සඳහා) | 5500.00 | 7000.00 |
| 02 | බැකෝ ලෝඩරය (මීටර් පැය එකක් සඳහා) | 4500.00 | 6000.00 |
| 04 | ගල් රෝල (මීටර් පැය එකක් සඳහා) | 4500.00 | 5500.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.15. ඇස්තමේන්තු අනුමත කිරීම.

පුවක් පැලේ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ විදුලි වැට ඉදි කිරීමට අදාල සෝලා පවර් යන්ත්‍රයේ උපාංග / බැටරි ආදිය ආරක්ෂිතව තබා ගැනීමට කුටියක් සකස් කිරීම සඳහා රු. 42,000.00 මුදලක් වැය වන බැවින් එම ඇස්තමේන්තු මුදල අනුමත කිරීම සුදුසු බවත් සභාවේ අරමුදල් ප්‍රමාණය සලකා බලා ඉදිකිරීම් කටයුතු සඳහා ගිවිසුම් ගත වීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16 අත්ට්‍රැක්ටරය නැවත භාවිතයට ගැනීම.

බිබිල ප්‍රාදේශීය සභාවේ දැනට භාවිතයෙන් ඉවත් කර ඇති අත්ට්‍රැක්ටරය අක්‍රීය වී ඇති අතර එහි මෝටරය ගලවා නැවත සකස් කිරීමට හා නැවත එය සකස් කල පසු ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතියේ වැඩ සඳහා ලබා ගැනීමට අනුමැතිය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17. 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන.

ගම සමඟ පිලිසදරක් වැඩසටහන යටතේ ආරම්භ කර ඇති සංවර්ධන ව්‍යාපෘතීන් රටේ වත්මන් තත්වය මත නතර වී ඇති අතර ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන ඇත්නම් මෙම ව්‍යාපෘති නැවත ආරම්භ කර පවත්වාගෙන යන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වා ඇති අතර එය එසේ සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18. බිබිල සතිපොල බහු කාර්ය ගොඩනැගිල්ලේ බිමට අතුරා ඇති ගල් ඉවත් කිරිම සම්බන්ධ වියදම් සහා අරමුදලින් දැරීමට අනුමැති ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල සතිපොල බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරිමේ දී බිමට අතුරා ඇති ඉන්ටර්ලොක් ගල්,ABC ගල් කුඩු හා විදුලි පහන් ඉවත් කිරීම සඳහා බැකෝ ලොඩර් යන්ත්‍රයක් හා ටිපර් රථයක් යොදා ගැනීමට සිදු වූ බැවින් ඒ සඳහා දැරු වියදම සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.19.අංක 11 දරණ එළවළු කඩකාමරයේ අයිතිය මාරු කිරීම සම්බන්ධවයි.

අංක 11 දරණ එළවළු කඩ කාමරය බදුගෙන සිටි බිබිල,බදුල්ලගම්මන,හෙල්ලිවත්ත ලිපිනයේ පදිංචි එච්.එම්.ජයලතා යන අයට අංක 11 දරණ එළවළු කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල,කණුගොල්ලවත්ත,ළිඳකුඹුර ලිපිනයේ පදිංචි එච්.එම්.සුමනාවතී මහත්මිය වෙත පවරා දෙන ලෙස ඉල්ලිමක් කර ඇති අතර එච්.එම්.සුමනාවතී මහත්මිය විසින් එම කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.20. කාබනික පොහොර සැකසීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ, ජේ.එම්.සමරසිංහ මහතා විසින් පුවක් පැලේ සණ අපද්‍රව්‍ය ඒකකයේ කාබනික පොහොර සකස් කිරීමේ මධ්‍යස්ථානය තුල නගරයේ කසල පමණක් යොදා ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කරන ලද අතර ඒ සඳහා වෙනත් සම්පත් ද සපයා ගැනීමට අවශ්‍ය බවත් දැනට ඇති ගොඩනැගිල්ල ප්‍රමාණවත් නොවන බැවින් අවශ්‍යව පවතින ෆයිල් සැකසීම සඳහා මිදුලෙහි කොටසක් කොන්ක්‍රීට් කර ගැනීමට අවශ්‍ය බවත් දන්වමින් ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම සාධාරණ බැවින් මෙය සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී පොහොර නිෂ්පාදනයට ගොඩනැගිල්ල ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අඩි 30*30 හෝ 40*40 දිග පළල හා උස අඟල් 2ක් පමණ සණකමකින් යුත් කොන්ක්‍රීට් එකක් මිදුලෙහි දැමීම සුදුසු බවත් පොහොර නිෂ්පාදනය සඳහා යොදන වෙනත් සම්පත් ලෙස කුකුල් පොහොර, ගොම පොහොර, පිදුරු,දහයියා හා ඇල්බීසියා යොදා ගැනීම මෙන්ම මේ සඳහා කාන්තා නියෝජත්වය ලබා ගැනීම සුදුසු බවටත් ගෙවතු වගාකරුවන්ට කොම්පොස්ට් ලබා දීම සඳහා ඔවුන්ව ලියාපදිංචි කිරීමත් කිලෝග්‍රෑම් 25ක පැකට් එකක් සකස් කර රු.1000.00ක මුදලකට අලෙවි කිරීමත් සුදුසු බවත්කාර්මික නිලධාරීතුමිය යොදා මේ සඳහා ඇස්මේන්තුවක් ලබා ගැනීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
පොහොර නිෂ්පාදනයට ගොඩනැගිල්ල ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අඩි 30*30 හෝ 40*40 දිග පළල හා උස අඟල් 2ක් පමණ සණකමකින් යුත් කොන්ක්‍රීට් එකක් මිදුලෙහි දැමීම සුදුසු බවත් පොහොර නිෂ්පාදනය සඳහා යොදන වෙනත් සම්පත් ලෙස කුකුල් පොහොර, ගොම පොහොර, පිදුරු,දහයියා හා ඇල්බීසියා යොදා ගැනීම මෙන්ම මේ සඳහා කාන්තා නියෝජත්වය ලබා ගැනීම සුදුසු බවටත් ගෙවතු වගාකරුවන්ට කොම්පොස්ට් ලබා දීම සඳහා ඔවුන්ව ලියාපදිංචි කිරීමත් කිලෝග්‍රෑම් 25ක පැකට් එකක් සකස් කර රු.1000.00ක මුදලකට අලෙවි කිරීමත් සුදුසු බවත් කාර්මික නිලධාරීතුමිය යොදා මේ සඳහා ඇස්මේන්තුවක් ලබා ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.21. ජංගම වෙළඳකුටි ලබා දීම සම්බන්දවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ 2022.01.20 දින පැවති මාසික සභා රැස්වීමේ අංක 05.01.08 සභා තීරණය අනුව ජංගම වෙළඳ කුටි ලබා දීමට සභාව විසින් තීරණය කරන ලද පිරිස එම වෙළඳ කුටි භාර ගැනීමට නොපැමිණි නිසා නව ඉල්ලුම්කරුවන්ට ගිවිසුම් ගතව ජංගම වෙළඳ කුටි ලබා දී ඇති අතර එසේ ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.දැනට ගිවිසුම් ගත වී ජංගම වෙළඳ කුටි ලබා ගත් අය ගේ විස්තර පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.

බිබිල නගරය තුළ ජංගම වෙළඳ කුටි

| අනු අංකය | නම | ලිපිනය | ජා.හැ.අංකය |
|---|---|---|---|
| 01 | දිසානායක මුදියන්සේලාගේ ගුණසේන | උණගොල්ල,බිබිල | 621533908V |
| 02 | ලංකා අසුර බංධනගේ චිත්‍රා | 85,රතුපස්කැටිය,බිබිල | 197485801294 |
| 03 | ඩී.එම්.අනුලාවති | ජේරගස්පිටිය,දියකොබල,බිබිල | 617202301 V |
| 04 | හේරත් මුදියන්සේලාගේ ජයසිංහ | 57/A, කොලොංකැටිය,ඉළුකාපතන,බිබිල | 831354496 V |
| 05 | ඩී.එම්. අනුලාවති | කනවේගල්ල,ඇකිරියන්කුඹුර,බිබිල | 707331410 V |
| 06 | බලවත් බණ්ඩාරලාගේ හීංමැණිකා | මල්ලැහැව,දියකොඹල,බිබිල | 727904573 V |
| 07 | ඩි.එම්.සරත් | පොරකටුව වත්ත,රදලියද්ද,බිබිල | 672854385 V |
| 08 | දිසානායක මුදියන්සේලාගේ උපුල් චන්දන දිසානායක | වෙඩ්ඩිගේ ගෙදරවත්ත,01 කණුව,බිබිල | 761823515 V |
| 09 | කිතුලේහේනේගෙදර වසන්තලාල් | ළිදකුඹුර,බිබිල | 196935404491 |
| 10 | කෝණාර මුදියන්සේලාගේ ගුණවති | දිඹුලමුලහේන,යල්කුඹුර,බිබිල | 195681103314 |
| 11 | එස්.ඩි.සරෝජා දේවි | තුඹලේරුව,වැගම,බිබිල | 765984432 V |
| 12 | ඩි.එම්.නදීශානි ප්‍රදීපිකා | පොල්ගහපිටිය,දොඩම්ගොල්ල,බිබිල | 198664503055 |
| 13 | එස්.එම්.රම්‍යකාන්ති | ගල්ගේලන්ද පාර,බිබිල | 707471336 V |
| 14 | එම්.නිශාන්ති | මහියංගණපාර,1 කණුව,බිබිල | 667141192 V |
| 15 | ඒ.එම්.කුලසිරි අබේවික්‍රම | උණගොල්ල,බිබිල | 690251973 V |
| 16 | එස්.එම්.කරුණාවති | මහියංගනපාර,02 කණුව,බිබිල | 625482887 V |
| 17 | ඒ.ජී.රංබණ්ඩා | මහවෙලපාර,උස්සාගල,බිබිල | 540824215 V |
| 18 | ඒ.එම්.සෝමාවති | මූන්වත්ත,දියකොලයාය,බදුල්ලගම්මන | 195665202896 |
| 19 | එච්.එම්.ලලිතාවති | කොලොන්ගොල්ල,යල්කුඹුර,බිබිල | 627241135 V |
| 20 | ඩී.එම්.චන්ද්‍රාවති | ගමගෙදර,පහලනුගහමුර,නන්නපුරාව | 715200139 V |
| 21 | එච්.එම්.ජනිතා හේරත් | අංක 99,තරුෂි නිවස,තානායම්ගම,යල්කුඹුර,බිබිල | 806084751 V |

| | | | |
|---|---|---|---|
| 22 | එච්.එම්.ඥානවති | අංක 37/1,කිවුලපිටිලන්ද,බිබිල | 198257002024 |
| 23 | ඩී.එම්.විජේසේන | අළුත්ගෙදර,කිවුලපිටිලන්ද,බිබිල | 740623087 V |
| 24 | ආර්.වී.ලීල් ගුනසිරි | මහියංගනපාර,බොරගල්ගොඩ,වැගම,බිබිල | 773660492 V |

<u>බිබිල නගරයෙන් පිටත ජංගම වෙළඳ කුටි</u>

| අනු අංකය | නම | ලිපිනය | ජා.හැ.අංකය |
|---|---|---|---|
| 01 | අතපත්තුගේ රෝහිත | අබේලන්ද ,බිබිල | 703545033 V |
| 02 | දිසානායක මුදියන්සේලාගේ ධර්මසිරි | අංක 98,දොඩම්ගොල්ල,බිබිල | 780274743 V |
| 03 | ජයසිංහගේ ජනක කැලුම් ජයසිංහ | 5 කණුව,වෙලේවත්ත,පිටකුඹුර,බිබිල | 843010326 V |
| 04 | රත්නායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා | දෙහිගහලන්ද,3 කණුව,වැගම,බිබිල | 352770272 V |
| 05 | ජේ.එම්.යසවති | පිටකුඹුර,බිබිල | 675984352 V |
| 06 | වීරකෝන් මුදියන්සේලාගේ නදීකා ප්‍රියදර්ශනී | උඩමල්ලැහැව,බිබිල | 875153730 V |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.22. ACTED ගොඩනැගිල්ලේ කඩ කාමර සඳහා කුලී මුදල් අය කිරීම සම්බන්ධවයි.</u>

පදික වේදිකාවේ වෙළඳාම් කරන වෙළඳුන් සඳහා මොණරාගල ඒකාබද්ධ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් බිබිල ප්‍රාදේශීය සභාවේ සහය ඇතිව බිබිල පොල භූමියේ කඩ කාමර ඉදිකර ඇත. මෙම කඩ කාමර සඳහා දැනට ගිවිසුම් ගත වී ඇති බදු කරුවන් විසින් ගෙවිය යුතු රු 50,000.00 ක කීමනි මුදලින් සියලුම බදුකරුවන් විසින් අවම රු 5000.00 ක් කී මනි ලෙස ගෙවා ඇත.

2022.02.02 දින acted කඩ කාමර බදු ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලද බදුකරුවන් හා සභාපතිතුමා, ඒකාබද්ධ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකාරක නිලධාරී මහත්මිය සමඟ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේ දී රැස්වීමක් පැවැත්විය. මෙම රැස්වීමේ දී බදුකරුවන් විසින් අදහස් දක්වමින් කොරෝනා වසංගතය සමඟ ජනතාව නගරයට පැමිණීම අඩු වීමත් සමඟ හා සතිපොල පැවැත්වීම නතර කිරීමත් සමඟ පාරිභෝගිකයින් නොපැමිණීම නිසා මෙම කඩ කාමර වල වෙළඳාම් කරන සමහර වෙළඳුන් එම ස්ථානයේ වෙළඳාම් කළ නොහැකි බැවින් ඉවත් වී ඇති බව පැවසීය.

දැනට මෙම කඩ කාමර වල කිසිවෙක් වෙළඳාම් සිදු නොකරන බැවින් හා සතිපොල එම ස්ථානයේ නොපැවැත්වෙන බැවින් මේ වන තෙක් එම කඩ කාමර වලින් කුලී මුදල් අය කර නැති අතර එම කඩ කුලිය නිදහස් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.23. ඇස්තමේන්තු මුදල ඉක්මවා වැය වන වියදම සහා අරමුදලින් දැරීම සම්බන්ධවයි.

බිබිල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමට සහා වාහන වලට අමතරව පිටතින් ටිපර් රථ,D4 ඩෝසර්, යන්ත්‍ර හා JCB යන්ත්‍ර ලබා ගත් අතර එම යන්ත්‍ර යොදා පිට්ටනියෙන් ඉවත් කල පස් බල ප්‍රදේශයට අදාල අතුරු පාරවල් සංවර්ධනය සඳහා යොද වන ලදි. මෙම සංවර්ධන කටයුත්ත සඳහා ඉන්ධන වියදම ලෙස ඇස්තමේන්තු ගත මුදල රු.1,989,393.00ක් වු අතර මෙම මුදල ඉක්මවා සිදුවු වියදම් සහා අරමුදලෙන් දැරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.24. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වැසිකිලි වසා තැබූ දින සඳහා සහනයක් ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශිය සභාවට අයත් බිබිල බස් නැවතුම්පොළ පොදු වැසිකිලිය බිබිල ප්‍රාදේශීය සභා සුභ සාධක සංගමය මගින් බදු ගෙන ඇත.2022.05.09 වන දින සිට 2022.05.16 දින දක්වා ඇදිරි නීතිය හා වෙසක් පොහොය නිසා වසා තැබීමට සිදු විය.එම දින 07 සඳහා සුභ සාධක සංගමය මගින් සභාවට ගෙවීමට ඇති මුදල රු.3703.00 ක් වන අතර මෙම මුදල් නිදහස් කර දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.25. නායකඳුර ජල ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම.

නාය කඳුර ජල ව්‍යාපෘතියේ (intake) තුළමුව ඉදි කිරිම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී තුළුමුවෙහි පළල ප්‍රමාණවත් නොවීම නිසා අඩි කිහිපයක් ඔසවා සකස් කර ජල පිරිපහදුව මඟින් ජලය ලබා දීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
තුළු මුවෙහි පළල ප්‍රමාණවත් නොවීම නිසා අඩි කිහිපයක් ඔසවා සකස් කර ජල පිරිපහදුව මඟින් ජලය ලබා දීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.26. හෙළ බොජුන්හල සඳහා කාන්තා ශ්‍රමිකයන් පුහුණු කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව මඟින් ආරම්භ කිරීමට නියමිත හෙළබොජුන් හලේ ආහාර සකස් කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2022.06.24 දින සිට දින 03 ක් ලබා දීමට කටයුතු සූදානම් කර ඇත. 2022.01.20 දිනැති සභා තීරණය අනුව හෙළ බොජුන් හලේ ආහාර සැකසීම සඳහා අවස්ථාව ඉල්ලා ඒ සඳහා අනුමැතිය ලැබී ඇති අයට මෙම පුහුණුව ලබා දීමට කටයුතු සූදානම් කර ඇත.

සාමාජිකාවන් 15 දෙනෙකු සඳහා නිලධාරීන් දෙදෙනෙකුගේ සම්පත් දායකත්වයෙන් 20 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන වෙනුවෙන් යන වියදම් ඇස්තමේන්තුව පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.

| | | | |
|---|---|---|---|
| තේ සඳහා | 100*20*2*3 | = | 12,000.00 |
| දිවා ආහාරය සඳහා | 300*20*3 | = | 18,000.00 |
| පුහුණුව හා ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට | | = | 15,600.00 |
| මොණරාගල හෙළ බොජුන් හල අධීක්ෂණය | | = | 15,000.00 |
| සම්පත් දායක දීමනා | | = | 14,400.00 |
| | | | **75,000.00** |

මේ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.27 බිබිල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

බිබිල ප්‍රදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමග කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්විම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව විගණකාධිපතිගේ වාර්තාවේ සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

කිසිවක් ඉදිරිපත් වී නැත

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලිම.

2022 මැයි මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 7,246,275.95** |
| මූලධන ලැබීම් | **- රු. -** |
| **ප්‍රාග්ධන ලැබීම්** | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 27,363,009.68 |
| මුළු ලැබීම් | - රු **34,609,285.63** |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 6,465,874.16 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 545,560.00 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 1,806,709.25 |
| ආයෝජන | රු. 27,000,000.00 |
| මුළු වියදම් | - රු 35,818,143.41 |

**2022.05.31 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 7,242,485.36 |
| අක්කර බදු | - රු. 1,026.96 |
| ජල ගාස්තු | - රු. 957,514.38 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 272,822.00 |
| කුලී මුදල් | - රු. 2,624,501.69 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - රු. 5,280,171.67 |
| එකතුව | - රු. 16,378,522.06 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.
ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

## 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා හා ඩී.එම්. කරුණාවතී මැතිතුමිය වෛද්‍ය හේතුන් මත මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 08.02. විශේෂ ප්‍රකාශන.

බිබිල බස් නැවතුම්පොලෙහි අනවසරයෙන් ඉදි කිරීම් සිදු වූ පසු ඒ පිළිබඳ තාක්ෂණ නිලධාරි යොදවා අධීක්ෂණය කර තොරතුරු රැගෙන නාගරික සංවර්ධන අධිකාරියෙහි උපදෙස් මත ක්‍රියා කළ බවත් මෙම කඩහිමියන් මෙය අනවසරයෙන් ඉදිකර ගත් දෙයක් නොවන බවත් තමාගේ අහිමු වූ ස්ථානය නැතිවෙයි යන හේතුව නිසා ඉදිකිරීම් සිදු කළ බවත් විධිමත් සැලැස්මක් නිර්මාණය කර මෙය විධිමත්ව සිදු කළහොත් ඔවුන් ඕනෑම අවස්ථාවක වෙළදසැල් ඉන් ඉවත් කර ගන්නා බවත් ලිපි මගින් දන්වා ඇති බවත් මේ පිළිබඳ සාකච්ඡා කිරිමට කමිටුවක් ඇති බවත් එම කමිටුවේ තීන්දුව ගන්නා තෙක් නඩු දැමීම තාවකාලිකව නවතා නිරවුල් වූ පසු විධිමත්ව මෙය කඩහිමිකරුවන්ට ලබා දීම සුදුසු බව සියළු මන්ත්‍රීවරුන් සාකච්ඡා කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්වීම.**

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් බස් නැවතුම්පොලෙහි කඩ ඉදිකිරිම පිළිබඳ කිසිදු විරුද්ධත්වයක් නොමැති බවත් මෙය විධිමත්ව හිටපු මිනිසුන්ට ලබා දී විධිමත් ලෙස කටයුතු කරන ලෙසත් තමාට කඩවල් 04 ක් ඇති බව මිනිසුන් පවසන බවත් තමාත් එම කඩවල් කොහෙද තියෙන්නේ යන්න සොයන බවත් එවැනි අරමුණක් තමාට නොමැති බවත් තමාට දිගු දේශපාලන ගමනක් යාමට බලාපොරොත්තුවක් ඇති බවත් තමාගේ

සහෝදරයෙක් වන සමන් නැමැති පුද්ගලයා කඩවල් අනවසරෙන් අල්ලාගෙන කරගෙන යන බවත් ඔහුගේ ක්‍රියා කලාප තමාටවත් තමාගේ පියාටවත් නැවැත්වීමට නොහැකි වූ බවත් එයට තමා සම්බන්ධ නොමැති බවත් නගරය දියුණු වීමට කැමති තරුණයෙක් ලෙස මෙය විධිමත්ව විය යුතු බවත් සභාපතිතුමා හෝ මෙයට මැදිහත් වී තාවකාලික බදු ක්‍රමයට හෝ මෙය ක්‍රමවත්ව ලබා දීමට කටයුතු සිදු කරන ලෙස  පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දැක්විම.

ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දක්වමින් කඩ සම්බන්ධව තමාත් එම ස්ථානයට ගොස් කඩ ඉදි කිරීම පිළිබඳ චෝදනා ඇති බවත් තමාටත් එම ස්ථානයේ කඩයක් තිබූ බවත් එදා එම කඩ විජයමුණි සොයිසා මැතිතුමා විසින් කඩා ඉවත් කළ අවස්ථාවේ දී ඒ පිළිබඳව පොලිසිය දැනුවත් නොකලේ එම කඩ කාමර වෙනම ඉදි කර දෙන බව පැවසූ නිසා බවත් ,  එදා මෙම ඉඩම ප්‍රාදේශිය සභාවට අයිති බවත් අපි ලග ඇති ලිපි ලේඛන අනුව එය සනාථ වන බවත් පළාත් සභාවෙන් ඉදි කළ කඩවල් වලින් අද ප්‍රාදේශීය සභාව කිසිදු ආදායමක් නොලබා එහි කුණු ටික අදින බවත් කඩහිමිකරුවන්ට සාධාරණයක් විය යුතු බවත් එම මිනිසුන්ට එම කඩකාමර ලබා දිය යුතු බවත් මේ සම්බන්ධව බලධාරීන් සම්බන්ධ කමිටුවක් සමඟ සාකච්ඡා කළ බවත් මෙය මසක් ඇතුලත විසදෙන බවත් සැම දෙනාටම මෙයින් සාධාරණයක් ඉටු වෙතැයි බලාපොරොත්තු වන බවත්  ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දැක්විම.

ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දක්වමින් තමාත් බස් නැවතුම්පල කඩකාමර සම්බන්ධව අදහස්  දක්වන බව ප්‍රකාශ කළ අතර නීතිඥානුකූල ආයතනයක් ලෙස බිබිල ප්‍රාදේශීය සභාව හඳුන්වන අතර මෙහි නැවත කැලෑ නීතිය ඇතිවන්නේ නම් එහි ගැටළුවක් ඇති බවත් සම්මත නීතිය හා කැලෑ නීතිය යන දෙකම පවත්වාගෙන යා නොහැකි බවත් මෙහි අසාධාරණයට ලක් වූ පිරිස් සිටින බවත් මෙවන් ගැටළුවක් ඇති වුනේ ඔබ තමුන්සේලාගේ දේශපාලන පක්ෂයෙන් බවත් එය ඔබලාම විසදිය යුතු බවත් පැවසීය.දැන් කරන කටයුත්ත නීතඥානුකූල විය යුතු බවත් මන්දයත් පූර්වාදර්ශය එතරම් හොඳ දෙයක් නොවන බවත් ව්‍යවස්ථාපිත නීතිය අනුව මෙම පරිශ්‍රය අපට අයිති නම් රජයේ ඉඩම් සන්තකය පවරා ගත හැකි බවත් පළාත් පාලන ආයතනයක් ලෙස එහි ඉදිකිරීම් සඳහා අපට සෘජුවම සම්බන්ධ වීමට සිදු වූ බවත් අනවසර ලෙස ඉදි වෙන මෙම ගොඩනැගිලි ඉදි වෙද්දී සභාවක් ලෙස මෙසේ බලා සිටීම වැරදි බවත් නීතිඥානුකූලව අපට වැඩ කිරිමට සිදු වන බවත් මේ සම්බන්ධව උසාවියට පොලීසිය විසින් කරුණු වාර්තා කරනු ලැබූ අවස්ථාවේ දී සභාව නියෝජනය කළ ලේකම්තුමිය මෙම ගැටළුව පිළිබඳ නොදැන ඉන්න ඇති කියා හිතන බවත් සභාව වෙනුවෙන් ස්ථාවරයක් හා අදහසක් හරි ගරු අධිකරණය ඉදිරියේ තැබුවේ නැති බවත් සභාව වෙනුවෙන්  පත්කල නීතිඥවරයා කිසිවක් නොකියා සිටිය බවත් පොලිසීයද මුලදී මෙය මහත් පීඩාවක් ලෙස පැවසුවත් අවසානයේ දී අදහස් ඉදිරිපත් නොකල බැවින් මෙම නඩුව නිශ්ප්‍රභා කර දැමූ බවත් මෙය අප ආයතනයෙන් සිදු වූ අතපසු වීමක් ලෙස තමා දකින බවත් නීතිමය කටයුතු අපි ඉදිරියේ දී කරමු යන්නත් අහිමි වූ අයට හොඳ ක්‍රියාවලියක් යටතේ ඔවුන්ට එම කඩ කාමර ලබා දීමට කටයුතු සිදු කිරීම සුදුසු බවත් ආණ්ඩුවත් පක්ෂයත් එකම නිසා මෙය සාකච්ඡා කර විසදීම සුදුසු බවත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා අදහස් දැක්විම.

ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා අදහස් දක්වමින් සභා ආඥා පනත යටතේ නීතිය පිළිබඳ ගැටළුව එක විටම කළ නොහැකි බවත් මුලින්ම පොලිසිය දැනුවත් කර ඉන්පසුව නිවේදනයක්

ඉදිරිපත් කල යුතු බවත් එය සභාව මගින් කළ බවත් දවස් 14 කින් පසු නඩු පවරන නිසා කට්ටිය එකතු වී සාකච්ඡා කළ බවත් සභාව විසින් පෙර කතා කළ නඩු සඳහා රු. ලක්ෂ 40ක් පමණ වියදම් කර ඇති බවත් මෙම නඩු තීන්දුව සඳහා තව කොපමණ මුදලක් වැය වේද යන්න නොදන්නා නිසා නීතිපතිතුමාගේ මාර්ගෝපදේශයකින් හෝ මෙය ඉටු කිරීමට බැලූ බවත් රටේ පවතින නීතිය යටතේ අපි කටයුතු කළ බවත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දැක්විම.

ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දක්වමින් කඩහිමියන්ට නඩු නොදමන ලෙසත් එම කඩහිමියන් සභාව කියන දේ අසන බවත් අවුරුදු 15 ක් පමණ තිස්සේ මේ මිනිසුන්ගේ ඉවසීම පිළිබඳව සතුටු විය යුතු බවත් අපි සකස් කළ සැලසුමට අනුව මෙම කඩකාමර ඉදි කලා නම් මෙම ගැටළුව විසඳෙන බවත් දැනටත් මෙය එසේ සිදු වී නැත්තේ දේශපාලනය නිසා බවත් සභා අරමුදලින් හෝ මෙම කඩ කාමර හිමිකරුවන්ට එම කඩ ලබා දී මෙය විධිමත් ලෙස කඩිනමින් ඉටු කරන ලෙසත් ඔප්පු සකස් කර මෙය ක්‍රියාත්මක කිරිමට විජිත බේරුගොඩ මැතිතුමා විරුද්ධ වූ බවත් නගර අලංකරණය යටතේ මෙය සකස් කරමු ලෙස එතුමා යෝජනා කළ බවත් මේ නිසා මෙය සිදු නොවුන බවත් මෙය නීතිඥානුකූලව සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය අදහස් දැක්විම.

ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය අදහස් දක්වමින් පළාත් පාලන ආයතන සමඟ UNDP ආයතනය සම්බන්ධ වී මාස 02 කට පෙර මන්ත්‍රීවරියන්ගේ ව්‍යාපෘති තෝරා ගැනීමේ ව්‍යාපෘතියක් ආරම්භ වූ බවත් එහි දී යෝජනා 63 කින් අපේ මන්ත්‍රීවරියන් 04 දෙනාගේ යෝජනා හතරම තේරී පත්වූ බවත් මන්ත්‍රීවරියන් 63 දෙනාගෙන් බිබිල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරියන් 04 දෙනාගෙම යෝජනා තේරී පත් වූ බවත් ලොකු උත්සවයක් පවත්වා අගය කිරීමකින් අනතුරුව මුදල් ලබා දුන් බවත් ඒ සඳහා අපේ සභාවෙන් කිසිදු නිලධාරියෙක් ඒ සඳහා සහභාගි නොවූ බවත් එම ලැබුන රුපියල් ලක්ෂ 10ක මුදල සභාවේ ගිණුමෙහි තැන්පත් කර ඇති නමුත් ඉන් පසුවත් පළාත් පාලනයෙන් අපව කැඳවා මෙම ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු සකස් කරන ආකාරය පිළිබඳ කියා දුන් අතර එදිනද සභාවේ යම්කිසි කාරණයක් නිසා සහභාගි නොවූ බවත් ඇස්තමේන්තු සකස් කිරිම පිළිබඳව තමන්ලා එතරම් දැනුවත් නොමැති නමුත් තම තමන්ට තේරෙන ආකාරයට සභාවට පැමිණ විස්තර පැවසූ නමුත් තවමත් කිසිදු කටයුත්තක් සිදුනොවන බවත් දවස් 02 කට පෙර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කතා කර මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන්නේ නම් එම මුදල් නැවත අයකර ගන්නා බවත් පැවසූ බවත් මේ පිළිබඳව සභාපතිතුමාගේ අවධානය යොමු කරමින් කාර්මික නිලධාරිතුමියගේ හා තුමාගේ මැදිහත් වීම මත ඊට අදාල කටයුතු කරන ලෙසේ ඉල්ලමින් සිය අදහස් දැක්විම නිමා කරන ලදී.

## මූලාසනය

ගරු මූලාසනය විසින් පිළිතුරු කථාව කරමින් ප්‍රකාශ කරමින් ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය ඇතුළු අනෙකුත් මන්ත්‍රීවරියන් 03 දෙනාටම කාර්මික නිලධාරීන් සමඟ සාකච්ඡා කර එම ඇස්තමේන්තු සකස් කර අදාළ රු. ලක්ෂ 10 ක මුදල මෙම ප්‍රදේශයේ ජනතාවට ලැබෙන ආකාරයට යෙදවිය යුතු බවත් බස්නැවතුම් පලේ ගැටළුව පිළිබඳ සාකච්ඡා කිරිමට විශේෂිත රැස්වීමක් ගන්නා බවත් මෙයට අදාල 45 දෙනෙකු සිටින බවත් මේ 45 දෙනාටම මෙම කඩ කාමර ලබා දීමට බලාපොරොත්තු වන බවත් ඉඩමේ අයිතිය සති 02ක් ඇතුලත නිරවුල් වන

බවත් ඉන් පසුව මහල් 03කට සෑදූ සැලැස්මට අනුව සැලසුම් කමිටුවට දමා අනුමත කරගෙන මෙම කඩකාමර සෑදීමට බලාපොරොත්තු වන බවත් 45 දෙනාගෙන් 35ක් පමණ අද වන සිටින බවත් ඇතැම් පුද්ගලයින් මිය ගොස් ඇති බවත් ඇතැම් පුද්ගලයින් රට හැර ගොස් ඇති බවත් පැවසීය. මෙහි දී ඇති වන අතිරික්තය සඳහා ඔප්පු ඇත්නම් අපේ මන්ත්‍රීවරුන්ටත් එක් අයෙකු නම් කිරිමට අවස්ථාවක් ලබා දීම වරදක් නොවන බවත් මෙම සැලැස්මට අනුව කඩකාමර 60ක් හෝ 70ක් පමණ ඉදිවන බවත් මිලියන 30කට ආසන්න මුදලක් සභාව සතු වන බැවින් පළමු සැලැස්ම මෙම මුදල් යොදවා සිදු කිරීමට හැකි බවත් පී.පී.පී. ක්‍රමයට අනුව ඉතිරි වැඩ ටික මිනිසුන්ගෙන් අයකරගෙන කළ හැකි බවත් මෙම මිනිසුන් නඩු නොදමන ලෙස පවසන්නේ නම් නඩු නොදමන බවත් පැවසීය.

එච්.එම්. සරත් කුමාර මැතිතුමා දැක්වූ අදහස් හොඳ බවත් අපේ සභා පනතේ සඳහන් වන්නේ අනවසර ඉදි කිරිමක් කළහොත් කාර්මික නිලධාරිගේ වාර්තාවක් රැගෙන නිවේදනයක් ඉදිරිපත් කර දින 14කින් ඉවත් කිරීමට අවස්ථාවක් ලබා දී එම දින 14 දී ඉවත් නොකරන්නේ නම් ඊළඟ අදියරයට යොමු වන බවත් පැවසීය.මේ ආකාරයට කටයුතු සිදු වූයේ ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයෙක් පළමුව ප්‍රාදේශීය සභාවට විරුද්ධව පැමිණිල්ලක් දමා තිබීම හේතුවෙන් නිසා බවත් ලේකම්තුමියට හා කාර්මික නිලධාරිතුමියට උසාවියට පැමිණීමට සිදු වූ බවත් ,ඉන් පසුව ප්‍රවාහන අධිකාරිය විසින් එම පැමිණිල්ල ඉවත් කර ගත් බවත් ඒ අනුව කටයුතු සිදු වූ බවත් සියළු දෙනාට සාධාරණය සිදු කළ යුතු බවත් නඩුවකට නොයා මෙය සිදු කරමු යන්න මිනිසුන් පවසන බවත් මෙයට විසඳුමක් ලැබී නැත්තේ එදා ප්‍රවාහන අධිකාරියට සම්බන්ධ පිරිස් කැල්ලක් සකස් කර ලක්ෂ 40කට හෝ 50කට අලෙවි කළ බවත් නැවත ටික කලකින් සකස් කර නැවත අලෙවි කරන බවත් එසේ කැලි 03ක් අලෙවි කර ඇති බවත් ප්‍රවාහන අධිකාරියට කඩයක් නැති නිසා සභාපතිවරයාට කොටසක් අලෙවි කිරිම නිසා මෙම ගැටළුව නිර්මාණය වී ඇති අතර ප්‍රවාහන අධිකාරියට, සභාපතිවරයාට හා ඔහුගේ සහෝදරයාට කැලි 05ක් මෙහි ඇති බවත් මෙය සාධාරණව කඩිනමින් ඉටු කරම් යන්න පවසමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

මීළඟ මාසික සභාව 2022 ජූලි මස 19 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත්

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.

ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා යටතේ ,

## <u>05.01.18. නාගරික හා ළමා උද්‍යානයක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගැනිම සම්බන්ධවයි.</u>

**<u>කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා කරුණු පැහැදිලි කිරීම</u>**.

මෙම යෝජනාව මඟින් සිදුකර ඇත්තේ ඉඩම **ලක්ෂ 50 ක් පමණ වටිනාකමකින් යුක්ත වන නමුත් එම ඉඩම තක්සේරු කොට** සහා අරමුදලින් ලබා ගැනීම සුදුසු බවටයි. එබැවින් මෙම ඉඩම තක්සේරු කර එක වර නොකර එකින් එක කිරිම සුදුසු බවත් මෙම ඉඩමට අනාගතයේ දී හොඳ වෙළඳ වටිනාකමක් ලැබෙන බැවින් මෙම ස්ථානය සුදුසු බවට අදහස් දැක්වීම ඇතුලත් කර සංශෝධනය කිරීම.

**<u>බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා,</u>** පොදු වෙළඳපල මාර්ගයේ ගල් ගැලවී පයින් මෙන්ම වාහනවලින්ද ගමන් කිරීමට නොහැකි බවත් එවැනි මාර්ග සංවර්ධනය සඳහා මුදල් යෙදවීම මෙම ඉඩම් මිල දී ගන්නවාට වඩා සුදුසු බවට දැක්වූ අදහස ඇතුලත් කර සංශෝධනය කිරීම.